සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW

**2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්** **07 S I, II**

**(නව නිර්දේශය)**

පැ තුනයි

**(07) ඉතිහාසය - I, II**

2018.12.27 /12.30 - 15.40

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ඉතිහාසය - I පත්‍රය

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක 1 සිට 15 දක්වා එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න. *(ලකුණු 01 × 40 = 40 යි)*

1. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනය සඳහා දැනට ඇති පැරණි ම වංසකථාව කුමක් ද?
   (1) දීපවංසය (2) මහාවංසය
   (3) දාඨාවංසය (4) ථූපවංසය

2. මහාවංස ටීකාව ලෙස සැලකෙන්නේ මින් කුමක් ද?
   (1) සීහල අට්ඨකථා මහාවංසයයි. (2) ධම්පියා අටුවා ගැටපදයයි.
   (3) වංසත්ථප්පකාසිනියයි. (4) සීහලවත්ථුපකරණයයි.

3. අනුරාධපුර යුගයේ බෞද්ධ ආරාම පාලනය පිළිබඳ තොරතුරු ඇතුළත් සෙල්ලිපිය වන්නේ,
   (1) මිහින්තලා පුවරු ලිපියයි. (2) ගොඩවාය ටැම් ලිපියයි.
   (3) ගල්පොත ලිපියයි. (4) හැබැස්ස සෙල්ලිපියයි.

4. "ඉතිහාසය හුදකලා විෂයයක් නොව විෂයයන් සමූහයක මිශ්‍රණයකි." මෙම ප්‍රකාශය කළේ,
   (1) වින්සන්ට් චර්චිල් ය. (2) ඊ. එච්. කාර් ය.
   (3) ජී. එම්. ටැව්ලියන් ය. (4) ටී. එස්. එලියට් ය.

5. අනුරාධපුර රාජධානියේ අවසාන පාලකයා කවුද?
   (1) පළමුවන විජයබාහු රජතුමා (2) අසේල රජතුමා
   (3) දෙවන අග්බෝ රජතුමා (4) පස්වන මහින්ද රජතුමා

6. තෝපා, දුඹුටුලු හා එරමුදු යන වැව් ඒකාබද්ධ කිරීමෙන් සෑදූ විශාල ජලාශය වන්නේ,
   (1) පරාක්‍රම සමුද්‍රයයි. (2) නිශ්ශංක සමුද්‍රයයි.
   (3) කලාවැවයි. (4) මින්නේරිය වැවයි.

[ 2 වැනි පිටුව බලන්න.

7. පාණ්ඩ්‍ය වංශික ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු ලංකාව ආක්‍රමණය කරන විට මෙරට පාලකයා වූයේ,
   (1) මානවම්ම රජු ය. (2) සූරතිස්ස රජු ය.
   (3) පළමුවන සේන රජු ය. (4) මිත්සෙන් රජු ය.

8. ලම්බකර්ණ වංශ රජපෙළපතේ ආරම්භක පාලකයා,
   (1) දේවානම්පිය තිස්ස රජු ය. (2) ධාතුසේන රජු ය.
   (3) මහසෙන් රජු ය. (4) වසභ රජු ය.

9. පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන ඉදිකරන ලද්දේ කුමන යුගයේ දී ද?
   (1) දඹදෙණිය (2) ගම්පොල (3) කුරුණෑගල (4) කෝට්ටේ

10. කෝට්ටේ රාජ්‍යය පෘතුගීසින්ට පවරා දෙන ලද්දේ කවරෙකු විසින් ද?
   (1) හත්වන බුවනෙකබාහු රජු (2) පළමුවන රාජසිංහ රජු
   (3) මායාදුන්නේ රජු (4) ධර්මපාල රජු

11. සුප්‍රකට ස්වේදගොන් චෛත්‍යය පිහිටියේ,
   (1) තායිලන්තයේ ය. (2) කාම්බෝජයේ ය.
   (3) බුරුමයේ (මියන්මාරයේ) ය. (4) ලාඕසයේ ය.

12. බොරෝබුදූර් විහාරය පිහිටා ඇති රට කුමක් ද?
   (1) චීනය (2) ඉන්දුනීසියාව (3) තායිලන්තය (4) බුරුමය (මියන්මාරය)

13. චීන දේශපාලන හා සමාජ දර්ශනය හැඩගැස්වීමට පාදක වූ දහම කුමක් ද?
   (1) කොන්ෆියුසියස් දහම (2) තාඕ දහම
   (3) බුදු දහම (4) සෙන් දහම

14. පෙරදිග රටවල් සඳහා වූ ලන්දේසීන්ගේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය කුමක් ද?
   (1) බතාවිය (2) කැලිකට් (3) පොන්ඩිචෙරි (4) ගෝව

15. ග්‍රීසිය අත්පත් කරගත් මැසිඩෝනියානු රජු කවුද?
   (1) දෙවන පිලිප් (2) ඔගස්ටස් සීසර්
   (3) මහා ඇලෙක්සැන්ඩර් (4) ජූලියස් සීසර්

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් හතර බැගින් දී ඇත. ඒවා අතුරින් එක් නමක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරන්න.

16. (1) රුවන්වැලි මහා සෑය (2) ලෝවාමහාපාය
   (3) ථූපාරාමය (4) අභයගිරිය

17. (1) කාලතිත්ථ (2) ජම්බුකෝල පට්ටන
   (3) චිත්තල පබ්බත (4) සූකරතිත්ථ

18. (1) බිසෝකොටුව (2) ධාතු ගර්භය (3) කොත් කැරැල්ල (4) පේසා වළලු

19. (1) නන්දිමිත්‍ර (2) ථෙර පුත්තාභය (3) සූරනිමල (4) දීඝජන්තු

20. (1) දුටුගැමුණු (2) නිශ්ශංකමල්ල (3) ධාතුසේන (4) වළගම්බා

● අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවල නාම/ප්‍රකාශන යුගල හතර බැගින් දී ඇත. ඒවා අතුරින් එක් නාම/ප්‍රකාශන යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන නාම/ප්‍රකාශන යුගලය තෝරන්න.

21. (1) පයිතගරස් - නවීන විද්‍යාවේ පියා
(2) හිපෝක්‍රටීස් - වෛද්‍ය විද්‍යාවේ පියා
(3) ඇරිස්ටෝටල් - තර්ක ශාස්ත්‍රයේ පියා
(4) ආකිමිඩීස් - ජලෝත් පීඩන න්‍යාය

22. (1) මහාතිත්ථ - මාතොට
(2) දේවනගර - දෙවනගල
(3) වාතගිරි - වාකිරිගල
(4) පලුට්ඨගිරි - පලටුපාන

23. (1) මහිසමණ්ඩලය - මහාදේව තෙර
(2) තම්බපණ්ණි - මහා මහින්ද තෙර
(3) ස්වර්ණභූමිය - සෝන හා උත්තර තෙරවරු
(4) කාශ්මීර සහ ගාන්ධාරය - රක්ඛිත තෙර

24. (1) කාවන්තිස්ස රජු - සද්ධාතිස්ස
(2) ධාතුසේන රජු - මුගලන්
(3) පළමුවන විජයබාහු රජු - නිශ්ශංකමල්ල
(4) ජයමහලැන - හයවන පරාක්‍රමබාහු

25. (1) වලගම්බා රජු - අභයගිරි විහාරය
(2) මහා පරාක්‍රමබාහු රජු - ගල් විහාරය
(3) මහසෙන් රජු - රන්කොත් වෙහෙර
(4) තුන්වන විජයබාහු රජු - දඹදෙණියේ විජයසුන්දරාරාමය

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (*A*), (*B*), (*C*) හා (*D*) යන ප්‍රතිචාර හතරක් දී ඇත. ඒවා අතුරෙන් දෙකක් නිවැරදි ය. එම නිවැරදි ප්‍රතිචාර දෙක තෝරා,

(*A*) සහ (*B*) පමණක් නිවැරදි නම්, අංක **1** ද,
(*B*) සහ (*C*) පමණක් නිවැරදි නම්, අංක **2** ද,
(*C*) සහ (*D*) පමණක් නිවැරදි නම්, අංක **3** ද,
(*A*) සහ (*D*) පමණක් නිවැරදි නම්, අංක **4** ද,

සලකුණු කරන්න.

26. රෝම අධිරාජ්‍යය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(*A*) – රෝම ජන සමාජය ප්‍රභූවරු, සාමාන්‍ය ජනයා හා වහල්ලු වශයෙන් කොටස් තුනකින් සමන්විත වීම
(*B*) – ඔගස්ටස් සීසර් විසින් රෝම අධිරාජ්‍යය පිහිටුවා ගනු ලැබීම
(*C*) – ඇරිස්ටෝටල් සහ ප්ලේටෝ වැනි දාර්ශනිකයින් පහළ වීම
(*D*) – ඔලිම්පික් ක්‍රීඩාවේ ආරම්භය

27. වසභ රාජ්‍ය සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද?
(*A*) – ගිරිතලේ වැව කරවීම
(*B*) – රන්මසු උයනේ පොකුණුවලට උමං මාර්ගයෙන් ජලය සැපයීම
(*C*) – ථූපාරාම දාගැබට වටදාගෙයක් කරවීම
(*D*) – මහකනදරාව වැව කරවීම

28. ගම්පොළ රාජධානි සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) – ගාල්ලේ ත්‍රි භාෂා ලිපිය පිහිටුවීම

(B) – විජයනගර් අධිරාජ්‍යයේ තොටුපළක් ආක්‍රමණය කිරීම

(C) – පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම

(D) – හතරවන බුවනෙකබාහු රජු විසින් ගම්පොළ රාජධානිය පිහිටුවීම

29. උඩරට රාජධානිය හා පෘතුගීසීන් අතර පැවැති සම්බන්ධතාව පිළිබඳ කවර ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) – කුසුමාසන දේවියට උඩරට සිංහාසනය පිළිබඳ අයිතිය ලබා දීම

(B) – පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථානය වශයෙන් බතාවිය තෝරා ගැනීම

(C) – අද්මිරාල් වෙස්ටර්වෝල්ඩ් සුවිශාල නැව් හමුදාවක් රැගෙන ශ්‍රී ලංකාවට පැමිණීම

(D) – දන්තුරේ සටනින් පළමුවන විමලධර්මසූරිය රජු ජය ගැනීම

30. ලන්දේසීන්ගේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ මොනවා ද?

(A) – කඳුරට ප්‍රදේශයේ කෝපි වගා කිරීම

(B) – සහල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා මුතුරාජවෙල අස්වැද්දීම

(C) – බොල්ගොඩ ඇළ කැපීම

(D) – කම්කරු පන්තියක් බිහි වීම

- අංක **31** සිට **35** දක්වා එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන සමූහයක් ***X*** හා ***Y*** තීරුවල දී ඇත. ***Y*** තීරුවේ ඇති නාම/ප්‍රකාශන ***X*** තීරුවේ ඇති නාම/ප්‍රකාශන සමග කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. ***Y*** තීරුවේ ඒවා ***X*** තීරුවේ අනුපිළිවෙළට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

31.

| X | Y |
|---|---|
| (1) ඇරිස්ටෝටල් | A – එදා හෙළදිව |
| (2) කොස්මස් | B – ඉන්ඩිකා |
| (3) රොබට් නොක්ස් | C – ඩිමුන්ඩෝ |
| (4) මෙගස්තිනස් | D – ටොපෝග්‍රැෆියා ක්‍රිස්ටියානා |

(1) *A, C, B, D* (2) *B, C, A, D* (3) *C, D, A, B* (4) *D, A, B, C*

32.

| X | Y |
|---|---|
| (1) අර්ධ ශුෂ්ක කලාපය | A – රාවණා ඇල්ල |
| (2) පහතරට වියළි කලාපය | B – පාහියංගල |
| (3) තෙත් කලාපය | C – බුන්දල |
| (4) කඳුරට වියළි අතරමැදි කලාපය | D – සිදුරංගල |

(1) *A, B, C, D* (2) *B, D, C, A* (3) *C, D, B, A* (4) *C, D, A, B*

33.

| X | Y |
|---|---|
| (1) දෝවාරික | A – කඩු දරන්නා |
| (2) නගරගුත්තික | B – ප්‍රධාන ලේකම් |
| (3) අසිග්ගාහක | C – දොරටු පාලක |
| (4) මහාලේනා | D – නගර පාලකයා |

(1) *A, B, C, D* (2) *B, C, A, D* (3) *C, D, A, B* (4) *D, B, A, C*

34. X | Y

(1) රළපනාව — A – වැවට බාහිර මූලයකින් ජලය ගෙන ඒම
(2) සොරොව්ව — B – වැව් බැම්ම සේදී යාම වැලකීම
(3) ඇතුළුවාන — C – වැවෙන් ජලය පිටතට ගෙන යාම
(4) පිටවාන — D – වැවේ අතිරික්ත ජලය පිට කිරීම

(1) *A, D, C, B* (2) *B, C, A, D* (3) *B, D, C, A* (4) *C, B, D, A*

35. X | Y

(1) අනුරාධපුරය — A – අස්ගිරි විහාරය
(2) පොළොන්නරුව — B – ගඩලාදෙණිය විහාරය
(3) කුරුණෑගල — C – ආලාහන පිරිවෙන
(4) ගම්පොළ — D – අභයගිරි පිරිවෙන

(1) *A, B, C, D* (2) *B, A, D, C* (3) *C, D, B, A* (4) *D, C, A, B*

● අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයෙහි ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. ඒ ඒ ප්‍රශ්නයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන කුමන ප්‍රකාශ යුගලය දැයි තෝරා, එහි අංකය සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවන ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 2 | නිවැරදි ය. | වැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36. | වළගම්බා රජු විසින් සෝමාරාම විහාරය ඉදිකරන ලදී. | නිශ්ශංකමල්ල රජතුමා විසින් පොළොන්නරුවේ තෙමහල් දළදා මැදුරක් ඉදි කරන ලදී. |
| 37. | ධාතුසේන රජු විසින් කලාවැව ඉදිකරන ලදී. | තුන්වෙනි විජයබාහු රජු විසින් බෙලිගල දළදා මාළිගාවක් ඉදි කරන ලදී. |
| 38. | 1802 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ආණ්ඩුකාරවරයා ලෙස සර් තෝමස් මේට්ලන්ඩ් පත් කෙරිණ. | සර් තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා විසින් රාජකාරි ක්‍රමය අහෝසි කරන ලදී. |
| 39. | ක්‍රි:පූ: හයවන සියවසේ ඉන්දියාවේ සියලු ම සොළොස් මහා ජනපදවල පැවතියේ රාජාණ්ඩු පාලන ක්‍රමය පමණි. | මෞර්ය පෙළපතේ ආරම්භක පාලකයා පළමුවන චන්ද්‍රගුප්ත වේ. |
| 40. | චෝළයන් විසින් තම පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරා ගන්නා ලදී. | චෝළයන් විසින් පොළොන්නරුව 'මුන්මුඩි චෝළ මණ්ඩලම්' ලෙස හඳුන්වන ලදී. |

**

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW | 2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර් | 07 S I,II

(නව නිර්දේශය)

## (07) ඉතිහාසය - I, II

## ඉතිහාසය - II පත්‍රය

✳ පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කර නම් කරන්න.
(ඇමුණුම 01)


1. කදම්බ නදී 2. දේව නගර 3. ගෝකණ්ණ
4. ගම්පොල 5. කදුරුගොඩ 6. කෝට්ටේ

*(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි.)*

● පහත දී ඇති *A* හා *B* රූප සටහන් අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) (අ) ***A*** වලින් දැක්වෙන රූපය කුමක් ද?
(ආ) මෙය පිහිටි ඓතිහාසික නගරය කුමක් ද?
(ඉ) මෙය ඉදිකරවන ලද්දේ කවුරුන් විසින් දැයි නම් කරන්න.

*(ලකුණු 03 යි)*



***A***

(iii) (අ) ***B*** රූපයෙන් දැක්වෙන පිළිමය කුමක් ද?
(ආ) මෙම පිළිමය ඉදිකරන ලද්දේ කිනම් රජුගේ කාලයේ දී ද?
(ඉ) මෙම පිළිමය ආසන්නයේ පිහිටි විශාල වැව කුමක් ද?

*(ලකුණු 03 යි)*



***B***

**2.** "ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනයෙහි ලා සාහිත්‍ය මූලාශ්‍රය ඉතා වැදගත් වේ."
(i) සාහිත්‍ය මූලාශ්‍රය ප්‍රධාන වර්ග දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*
(ii) ඉහත (i) ට අදාළව ඔබ විසින් නම් කරන ලද සාහිත්‍ය මූලාශ්‍රය වර්ග දෙකට උදාහරණ දෙක බැගින් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*
(iii) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහි ලා සාහිත්‍ය මූලාශ්‍රයවල වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**3.** (i) මහින්දාගමනයට පෙර ලංකාවේ පැවැති ආගමික ඇදහිලි හා විශ්වාස දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*
(ii) බුදු දහම ඉතා කෙටි කලකින් මෙරට ව්‍යාප්ත වීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*
(iii) මිහිඳු මා හිමියන්ගේ වැඩමවීම ශ්‍රී ලාංකීය ජන සමාජයේ පරිවර්තනයක් ඇතිකර ලීමට හේතු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

[ 7 වැනි පිටුව බලන්න.

**4.** "අනුරාධපුර යුගයේ දී රජු මුල් කරගත් පාලන සංවිධානයක් ගොඩනැගී පැවතිණි."

(i) අනුරාධපුර යුගයේ දී රජකම උරුම වූ ක්‍රම දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) රජතුමාගෙන් රටවැසියා බලාපොරොත්තු වූ ප්‍රධාන වගකීම් දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) අනුරාධපුර යුගයේ දී ගම් පාලනය සිදු වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**5.** (i) පොළොන්නරු රාජධානිය පාලනය කළ වැදගත් රජවරු දෙදෙනෙකු නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) පොළොන්නරුව රාජ්‍ය මධ්‍යස්ථානයක් ලෙස තෝරා ගැනීමට හේතු දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) පොළොන්නරුව රාජධානිය පරිහානිය හා බිඳවැටීමට බලපෑ හේතු දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**6.** (i) පෘතුගීසීන් ලංකාවට පැමිණි අවධියේ දී මෙරට පැවති රාජධානි දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) පෘතුගීසි ආගමික ප්‍රතිපත්තිය නිසා ඇති වූ ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) ලන්දේසීන් ශ්‍රී ලංකාවේ දී අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තියේ ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

**7.** ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමය ඇසුරින් පහත සඳහන් මාතෘකා දෙක පැහැදිලි කරන්න.

(i) 1817 - 1818 නිදහස් අරගලයට හේතු

(ii) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා

*(ලකුණු 06 × 2 = 12 යි)*

**8.** පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ ඓතිහාසික තොරතුරු දක්වන්න.

(i) ග්‍රීකයන්ගේ ආගමික ඇදහිලි හා විශ්වාස

(ii) පැරණි ඉන්දියාවේ සොළොස් මහා ජනපද

(iii) ද්වරවතී ශිෂ්ටාචාරය

(iv) අශෝක අධිරාජ්‍යයාගේ ධර්මවිජය ප්‍රතිපත්තිය

*(ලකුණු 06 × 2 = 12 යි)*

* * *

3026

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2018 දෙසැම්බර්**

**(නව නිර්දේශය)**

**(07) ඉතිහාසය - II පත්‍රය**

**II** වන කොටසේ ප්‍රශ්න අංක **1** (i) ට පිළිතුරු සැපයීම සඳහා මෙම සිතියම භාවිත කරන්න. පිළිතුරු සැපයීමෙන් පසුව මෙය ඔබේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාරදෙන්න.

**විභාග අංකය :** ...........................

**1** (i)

